## ටවර් හෝල් රඟහල පදනම - 2015

------------------------------------------

ටවර් හෝල් රඟහල පදනමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ටවර්හෝල් රඟහල පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය, වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 108,055,536 ක්වූ ස්ථාවර වත්කම් අයිතම 12 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනම සතු ගොඩනැගිල්ල 2007 වර්ෂයේදී රු.මිලියන 200 කට තක්සේරු කර තිබුණද 2015 දෙසැම්බර් 31 දින දක්වාම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු. 408,585 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| මුදල් පරිත්‍යාග | 18,577,319 | අදාල ලිපිගොනු හා පරිත්‍යාග උපලේඛන |
| ද්‍රව්‍යමය පරිත්‍යාග | | |
| ජපන් රජයෙන් උපකරණ ආධාර | 58,890,541 | |
| | 16,072,000 | |
| පිරියත හා උපකරණ | 687,635 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශබ්දාගාර සේවා ලබාදීම වෙනුවෙන් රජයේ ආයතන දෙකකින් රු. 25,735 ක්ද, බාහිර පුද්ගලයන් 5 දෙනෙකුගෙන් රු. 56,580 ක් ද වශයෙන් වර්ෂ 02 ටත් වැඩි කාලයක සිට අයවිය යුතු එකතුව රු. 82,315 ක මුදල 2016 ඔක්තෝබර් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට පරිශේෂව පැවති බාහිර පුද්ගලයෙකුට සහ පදනමේ නිලධාරියෙකුට පිළිවෙලින් ලබාදුන් රු. 25,000 ක් හා රු. 51,007 ක්වූ අත්තිකාරම් දෙකක් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන 10 කට ගෙවිය යුතු සාප්පු කුලී රු. 432,961 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) ටවර් හෝල් රඟහල නවීකරණය කිරීමේ කටයුතු අවසන් කර වසර 05 කට ආසන්න කාලයක් ගතවුවද ඒ වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශයට ගෙවිය යුතුව තිබෙන 2010 වර්ෂයේදී රඳවාගත් රු. 1,639,113 ක් නිරවුල් කිරීමට 2016 ඔක්තෝබර් දක්වා කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පදනම විසින් ස්ථාවර තැන්පතුවල රු.111,019,428 ක් සහ සත්දින ඉල්ලුම් තැන්පතුවල රු.13,502,000 ක් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | රඟහල් කළමනාකරු තනතුරට එක් නිලධාරියෙකු වසර 7 ක සිටද, තවත් නිලධාරියෙකු වසර 3 ක සිටද වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබූ අතර ඒ වෙනුවෙන් 2014 සහ 2015 වර්ෂ තුල පිළිවෙලින් රු. 164,415 ක් හා රු. 123,240 ක් වැඩබැලීමේ වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 8.3.5 වගන්තිය | රඟහල පදනමේ අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්) වෙත නිල වාහනයක් හා ඒ සඳහා ඉන්ධන දීමනා ලෙස 2015 ජනවාරි සිට 2015 මැයි දක්වා රු. 86,500 ක්ද, 2014 වර්ෂයේ රු. 268,800 ක්ද චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 12,050,421 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 12,681,847 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.631,426 කින් අඩු වී තිබුණි. මුළු ආදායම රු.2,173,513 කින් අඩු වුවද මුළු වියදම රු.2,804,939 කින් අඩුවීම නිසා ඌනතාවයේ අඩුවීමක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු. 25,614,800 ක්වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂයේදී රු.31,686,747 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ජාතික නෘත්‍ය කටයුතු දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම, රඟහල පිළිබඳ දැනුම, අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම, රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහාය වීම, ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීම හා ඒ පිළිබඳ පරීක්ෂණ කිරීම සහ ඒවා රඟ දැක්වීමේ නියුක්ත වීම, මණ්ඩලය සුදුසු යැයි සලකන කාර්යයන් සඳහා ටවර්හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යෑම සහ ප්‍රයෝජනයට ගැනීම පදනමේ ප්‍රධාන පරමාර්ථ විය.

ක්‍රියාකාරි සැලැස්මට අනුව එම පරමාර්ථ යටතේ සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට ඉලක්කගත කළ කාර්යයන් 28 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණද එයින් කාර්යයන් 14 ක් ඉටුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රුක්මණීදේවී රංග ශාලාවේ ආදායම රු. 408,840 ක් වුවද එහි සේවක වැටුප් වියදම රු. 1,574,286 ක් විය. පසුගිය වර්ෂ 05 තුල එහි නඩත්තු වියදම හෝ ආවරණය වන පරිදි එහි ආදායම වැඩිකර ගැනීමට පදනම අපොහොසත්වී තිබුණි.

(ආ) (i) ටවර්හෝල් රඟහල පදනම මගින් නූර්ති ගී සංරක්ෂණය සඳහා නිෂ්පාදනය කළ සංයුක්ත තැටි අලෙවි කරනු ලබන අතර 2013, 2014 හා 2015 වර්ෂ තුලදී නිෂ්පාදනය කළ සංයුක්ත තැටි / පොත් සඳහා නිෂ්පාදන වියදම රු. 2,901,126 ක් වුවද එම කාලය තුල සංයුක්ත තැටි / පොත් අලෙවි ආදායම රු. 481,944 ක් විය. එම කාලය තුල ආදායමට සාපේක්ෂව වියදම රු. 2,419,182 කින් ඉක්මවා තිබූ අතර අවම වශයෙන් නිෂ්පාදන වියදම පියවා ගැනීමටවත් හැකිවන පරිදිවත් සංයුක්ත තැටි අලෙවි කර ගැනීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් පදනම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නිෂ්පාදනය කළ සංයුක්ත තැටි වර්ග 25 න් සංයුක්ත තැටි වර්ග 13 කට අයත් ඒකක 10,160 න් ඒකක 6,814 ක් විකුණාගත නොහැකිව සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිව පැවතුණි.

(ඇ) ප්‍රාසාංගික කලාකරුවන් සඳහා වන ජනාධිපති සුභසාධක අරමුදලේ පාලනය සඳහා ටවර්හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩලයට වගකිව යුතු, කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණද 2011 අගෝස්තු 29 දිනෙන් පසුව එමඟින් සුභසාධක අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරියකු බඳවා ගැනීමට පුවත්පත් 05 ක දැන්වීම් පළකිරීමට රු. 163,736 ක් වැයකර 2015 ජනවාරි 21 දින කැඳවූ අයදුම්පත්වලට 15 දෙනෙකු අයදුම් කර තිබුණද ඔවුන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමකින්ද තොරව 2015 ජූලි 02 දින පාලක මණ්ඩල සභාපතිවරයා විසින් එම තනතුරට ඊට බාහිර පුද්ගලයකු පත්කර තිබුණි.

(ආ) පදනමේ හිටපු ජ්‍යෝෂ්ඨ කළමනාකරු (පිරිස් පාලන ) 2010 පෙබරවාරි 12 දින අසාධාරණ හා අයුක්ති සහගත සේවා සමාප්තිය කිරීම හේතුවෙන් පවරා තිබූ නඩුවට රු. 257,160 ක වන්දියක්ද 2009 නොවැම්බර් 04 දින සේවයෙන් ඉවත්කළ ගණකාධිකාරිණිය විසින් පවරන ලද නඩුව සමථයකට පත්කිරීම වෙනුවෙන් රු. 500,000 ක්ද සමාලෝචිත වර්ෂය තුළදී පදනම විසින් ගෙවා තිබුණි. මේ අනුව ඉහළ කළමනාකරණය විසින් සේවකයින් ඉවත්කිරීම සාධාරණව සිදුකළ බව තහවුරු කිරීමට නොහැකි වීම නිසා සේවකයින් දෙදෙනකුට රු. 757,160 ක් වන්දි ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ කටයුතු නිමවීමට ප්‍රථම 2015 පෙබරවාරි වනවිට එක්තරා සමාගමකින් රු. 12,768,000 ක් වටිනා ආසන 700 ක් ලබාගෙන එයින් සියයට 80 ක මුදලක් ගෙවා තිබුණි. ආසන සවි කිරීමෙන් පසු නිසි ප්‍රමිතියකින් යුක්තද යන්න පරීක්ෂා කර ගෙවීම් කළයුතු වුවද ඒ අනුව කටයුතු සිදුවී නොතිබුණු අතර එම ආසන 2016 ඔක්තෝබර් 30 වන විටත් ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව පැවතුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

---------------------------------

එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ ව්‍යාපෘතියට සමාලෝචිත වර්ෂයේදී අවස්ථා දෙකකදී ලැබුණු රු.50,298,221 ක ප්‍රාග්ධන ප්‍රදානයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 17 ක් ඉතිරිව පැවතුණි.

**4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

------------------------------------------

(අ) එල්ෆින්ස්ටන් රඟහල සඳහා රු. 42,136,294 ක් වැයකර වායු සමීකරණ පද්ධතියක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(i) මිලගණන් කැඳවා ටෙන්ඩරය පිරිනැමීමට මාස 10 ක් ගතවී තිබුණි.

(ii) ඇස්තමේන්තුගත මුදල වූ රු.මිලියන 30 ඉක්මවා රු. 12,136,294 ක් වියදම් දරා තිබුණි.

(iii) මිලගණන් කැඳවූ අවස්ථාවේ තිබූ කොන්දේසි 2 ක් පසු අවස්ථාවක ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ඉවත් කිරීම නිසා තෝරාගත් ආයතනය රු. 8,906,090 ක් මිල අඩුකර සපයා තිබුණද, එම කොන්දේසි ඉවත් කළ පසු අනෙකුත් ලංසුකරුවන්ගේ මිලගණන්ද නැවත ඇගයීමක් කළයුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(iv) මෙම යන්ත්‍රයේ නඩත්තු සේවා වියදම් හා දැරීමට සිදුවිය හැකි අමතර පිරිවැය සලකා බැලීමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

(ආ) එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍යවූ මුළු ද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ශ්‍රමය සපයාගෙන තිබුණද ඒ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එසේ වුවද ශ්‍රමිකයන් සැපයීම වෙනුවෙන් 2012 මැයි 31 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට මිනිස් දින 47,338 ක් සඳහා රු. 21,302,100 ක් ගෙවා තිබුණි.

(iii) ශ්‍රහස්ථ විදුලි රැහැන් ඇදීම, දොරවල් සැකසීම සඳහා ලී මිලදී ගැනීම, ආසන සවිකිරීම, වේදිකා ආලෝකකරණය හා ආලෝක පද්ධතිය සවිකිරීම ආදී ගිවිසුම් ගත සේවාවන් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 22,432,882 ක අත්තිකාරම් ගෙවා තිබුණද ගිවිසුම් ගත කාර්යයන් විගණන දිනය වූ 2016 මාර්තු 28 දින වන විටත් ඉටුකර නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලය 2015 දෙසැම්බර් 31 දිනට 91 ක් වුවද එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 61 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් විය. එම පුරප්පාඩු අතර අධ්‍යක්ෂ මුදල්, අභ්‍යන්තර විගණක, ගිණුම් සහකාර හා ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලන තනතුරු 01 බැගින්ද රුක්මණීදේවි හා එල්ෆින්ස්ටන් රඟහල් කළමනාකරු තනතුරු 02 ක්ද පුරප්පාඩු වීම නිසා එම අංශවල ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරියෙකු නැවත සේවයට බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9 වන වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අවුරුදු 60 ඉක්මවූ නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015 ජූලි 02 දින පත්කර තිබුණි.

## 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් පදනමේ සම්පත්

-------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව ආයතනය සතු සම්පත් බාහිර පුද්ගලයින් හෝ රේඛීය අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබා නොදිය යුතු වුවද එම චක්‍රලේඛයට පටහැනිව 2015 මුල් මාස 06 තුල කිලෝ මීටර් 7,095 ක් ධාවනය කිරීම සඳහා වාහන 04 ක් විවිධ අවස්ථාවලදී රේඛීය අමාත්‍යාංශයට සහ රාජ්‍ය ආයතන දෙකකට නිදහස් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

---

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 3 ½ ක කාල ප්‍රමාදයකින් පසුව 2016 ජුනි 16 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

---

සමාලෝචිත වර්ෂය ආවරණය වන සේ පදනම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---

2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.2 වගන්තිය අනුව ක්‍රියාකාරි සැලැස්මෙහි ආයතනයේ අරමුණු හා ඉලක්කයන් ඉටුකර ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා වගකීම පවරනු ලබන නිලධාරියා නිශ්චිත වශයෙන් දක්වා තිබිය යුතු වුවද, පදනමේ ක්‍රියාකාරී සැලැස්ම ඒ අනුව පිළියෙල කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

---

පදනම විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.5 අභ්‍යන්තර විගණනය**

---

පදනමේ අභ්‍යන්තර විගණක තනතුර පිරවීම සඳහා 2011 ජූලි 20 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද, එදින සිට විගණන දිනය වූ 2016 ඔක්තෝබර් දක්වාම එම තනතුර පිරවීමට කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර රේඛීය අමාත්‍යාංශය විසින්ද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**5.6 විගණන හා කළමනාකරණ කමිටු**

---

2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ඇතැම් ගොඩනැගිලි ගිණුම්ගත නොකිරීම හා ඒවා ක්ෂය නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) නිසි සැලසුමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම මත අනවශ්‍ය වියදම් දැරීමට සිදුවීම.<br>(ii) ප්‍රසම්පාදන විධිවිධානවලට පටහැනිව කටයුතු කිරීම.<br>(iii) ඉදිකිරීම් හා නවීකරණ කටයුතු නිශ්චිත කාල රාමුවක් තුළ ඉටුකරවා ගෙන නොතිබීම. |
| (ඈ) | අරමුදල් කළමනාකරණය | නිසි සැලසුමකින් තොරව භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන එම මුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා නොයොදවා ඵලදායී නොවන ආයෝජනයන්හි යොදවා තිබීම. |